# බෙන්තොට පහළගම්හය ගොවිජන සේවා කොට්ඨාසයේ කුඹුරු ඉඩම් අතහැර දැමීමට බලපාන සාධක

ඒ. එච් හංසිකා[1*], එස්.ටී.සී අමරසිංහ[1], ටී.ජී.අයි සඳමාලි[2]

[1]කෘෂි ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

[2]වී පර්යේෂණ ස්ථානය, බෙන්තොට

විද්‍යුත් තැපැල:*hansikahasini4@gmail.com

පරිවර්තනය - ඒ.එච් හංසිකා

## හැඳින්වීම (Introduction)

ශ්‍රී ලංකාවේ වී කර්මාන්තය රටේ ආහාර අවශ්‍යතා සපුරාලීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරයි. පහතරට තෙත් කලාපය සෑම විටම සහල් නිෂ්පාදනයේ ස්වාරක්ෂක කලාපයක් ලෙස සේවය කරයි. ජාතික ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා, පහතරට තෙත් කලාපයේ කඹුරු ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන වාණිජ බෝගය වී වේ. බෙන්තොට ප්‍රදේශයේ 1983 වසරේ හෙක්ටයාර් 2524ක් වූ කුඹුරු ඉඩම් වගා කළ අතර 2013 වසරේ වගා කර ඇත්තේ හෙක්ටයාර 245ක් පමණ අතහැර දමා ඇත හෙක්ටයාර් 1385ක් පමණ කුඹුරු 2018 වන විටත් කිසිවකට ප්‍රයෝජනයට ගෙන නැත (පියදාස, රණසිංහ සහ හේරත්, 2018). කළුතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල පිළිවෙලින් අක්කර 12456ක් සහ අක්කර 10005ක් වගා කළ හැකි පුරන් කුඹුරු ඉඩම් ඇත. බෙන්තොට ප්‍රදේශය කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතා මට්ටමට වඩා පහළින් ඇති අතර, මෙම අති විශාල අතහැර දමා ඇති කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු උපාය මාර්ගයක් ක්‍රියාත්මක කර හෝ හඳුන්වා දී නොමැත. බෙන්තොට පහළගම්හය ගොවිජන සේවා කොට්ඨාශයේ කුඹුරු ඉඩම් අත්හැරීමට බලපාන සාධක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ. කුඹුරු ඉඩම් අත්හැරීමට හේතු සාධක හඳුනා ගැනීම ගැටලු නිරාකරණය කර ගනිමින් වී නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට උපකාරී වනු ඇත. මෙම පර්යේෂණය ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට පහළගම්හය ගොවිජන සේවා කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරීම මඟින් මෙම ප්‍රදේශයේ කුඹුරු ඉඩම් අත්හැරීමේ ප්‍රවණතාව අවම වන අතර ගාල්ල දිස්ත්‍රික් වී නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය (Methodology)

බෙන්තොට පහළගම්හය ගොවිජන සේවා කොට්ඨාශය මූලික වශයෙන් අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගෙන ඇති අතර එහිදී සමීක්ෂණ ක්‍රමෝපාය හරහා මූලික දත්ත රැස්කිරීමේ දී අරමුණ අනුව (purposive sampling) වී ගොවීන් 100 දෙනෙකු තෝරා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා මූලික දත්ත රැස් කිරීම සඳහා ව්‍යුහගත

ප්‍රශ්නාවලියක් නිර්මාණය කරන ලදී. බෙන්තොට ප්‍රදේශයේ කුඹුරු අතහැර දමා ඇති වී ගොවීන් වෙත මෙම ප්‍රශ්නපත්‍ර බෙදාදීම සිදු කෙරුණි. ප්‍රශ්නාවලිය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත විය. පළමු කොටස සමාජ-ආර්ථික සහ වී වගාව සම්බන්ධ තොරතුරු රැස් කිරීමට අනුගත විය. දෙවන කොටස කුඹුරු ඉඩම් අත්හැරීමට බලපාන සාධක සම්බන්ධ තොරතුරු කෙරෙහි අවධානය යොමු කළේය.

දත්ත විශ්ලේෂණය කිරීම සඳහා බහු ප්‍රතිගාමී විශ්ලේෂණය (Multiple regression), විස්තරාත්මක සංඛ්‍යාලේඛන (Descriptive statistics), සාමාන්‍ය බව (Normality), විශ්වාසනීයත්වය (Reliability) සහ වලංගුතා පරීක්ෂණ (Validity test) භාවිතා කරන ලදී. දත්ත සංඛ්‍යානමය වශයෙන් විශ්ලේෂණය කිරීමට SPSS 22 සහ MS Excel 2010 මෘදුකාංග භාවිතා කරන ලදී. සමාජ-ආර්ථික තොරතුරු වැනි ප්‍රාථමික දත්ත විශ්ලේෂණය කිරීමට විස්තරාත්මක සංඛ්‍යාලේඛන භාවිතා කළ අතර කුඹුරු ඉඩම් අත්හැරීමට හේතු සාධක විශ්ලේෂණය කිරීම සඳහා බහු ප්‍රතිගාමී විශ්ලේෂණය භාවිතා කරන ලදී.

## ප්‍රතිඵලය විශ්ලේෂණය (Result and Discussion)

ප්‍රතිඵලවලට අනුව කුඹුරු ඉඩම් අත්හැරීමට ලවණතාව බලපෑමක් ඇති කරයි. දේශගුණික තත්ත්වයන් වෙනස් වීම නිසා ඇතිවන ලවණ ගැටලු නිසා බෙන්තොට ප්‍රදේශයේ වී වගා කරන බොහෝ ඉඩම්වල ඵලදායිතාව අඩු විය හැක. උදම් රළ හරහා ලවණ සමුච්චය වීම සහ දේශගුණය නිසා ඇතිවන මුහුදු ජලය ආක්‍රමණය වීම නිසා බෙන්තොට වෙරළබඩ කුඹුරුවල ලවණ මට්ටම ඉහළ යයි. නිතර ඇතිවන ගංවතුර තත්ත්වයන් ද කුඹුරු ඉඩම් අත්හැරීමට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2000 ඉක්මවන විට තෙත් කලාපයේ ප්‍රධාන ගැටලුව ජලාපවහනය බව පෙනේ (ධනපාල 2005). අධික වර්ෂාපතනය හේතුවෙන් ගංවතුර තත්ත්වයන් බෙන්තොට පහළගම්භය ගොවිජන සේවා කොට්ඨාශයේ පහත් බිම්වලට බලපෑ හැකිය. කුඹුරු ඉඩම් අත්හැරීම සඳහා වන සතුන්ගේ හානිය සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. කුඹුරු ඉඩම් අත්හැරීමට වල් ඌරන් හානි කිරීම වැඩි වශයෙන් බලපා ඇත. මේ ප්‍රදේශයේ ගොවීන් වන සතුන්ගෙන් දැඩි තර්ජනයකට මුහුණ දී ඇත. වන සතුන්ගෙන් සිදුවන හානිය නිසා කාලයත් සමඟ අස්වැන්න අඩු වී ඇති අතර කුඹුරු ඉඩම් අතහැරීමට එය දැඩි බලපෑමක් වී ඇත. තවදුරටත් මෙම ප්‍රදේශයේ පවතින දුර්වල ජලාපවහන පද්ධතිය කුඹුරු ඉඩම් අතහැර දැමීම වැඩි වීමට හේතු වී ඇත. දුර්වල ජලාපවහන පද්ධති නිසා සමහර විට අධික වර්ෂාපතනයෙන් මුළු අස්වැන්නම අහිමි වී ජලයෙන් යටවීමේ තත්ත්වයන් ඇතිවන අතර එයද කුඹුරු ඉඩම් අත්හැරීමට හේතු විය. ඊට අමතරව ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම කුඹුරු ඉඩම් අත්හැරීමට අහිතකර ලෙස බලපායි. කුඹුරු ඉඩම් වලට ප්‍රවේශ මාර්ග දුර්වල වීමත් සමඟ වී වගා කටයුතු කිරීම දුෂ්කර වන බැවින් මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් නොමැතිකම හේතුවෙන් ගොවීන් කුඹුරු අතහැර දමා ඇත.

## නිගමන (Conclusions)

මෙම පර්යේෂණයේදී අපට නිගමනය කළ හැක්කේ අධික ලවණතාව, නිරන්තර ගංවතුර තත්ත්වය, දුර්වල ජලාපවහන පද්ධතිය, කුඹුරුවලට ප්‍රවේශ මාර්ග නොමැතිකම සහ වනසතුන්ගේ හානිය මෙම ප්‍රදේශයේ කුඹුරු අත්හැරීමට සැලකිය

යුතු ලෙස බලපාන බවයි. ලවණ තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි වී වර්ග භාවිතය, නිසි ජලාපවහන පද්ධතියක් පවත්වාගෙනයාම, වඩාත් අනතුරුදායක මාසවලදී මුහුදු ජලය ආක්‍රමණය කිරීම තුරන් කිරීම සඳහා පහළගම්හය ප්‍රදේශයේ කුඹුරු ඉඩම් වල හැකි සෑම තැනකම බැමි සකස් කර නිසි ලෙස නඩත්තු කළ හැකිය. වන සතුන්ගෙන් සිදුවන හානිය වැලැක්වීමට වැට බැඳීම සහ මාර්ග පහසුකම් වැනි ග්‍රාමීය යටිතල පහසුකම් රජය විසින් සංවර්ධනය කිරීම මඟින් ගොවියාගේ දුෂ්කරතා අවම වන අතර, අතහැර දමා ඇති කුඹුරු ප්‍රමාණය අවම කිරීමට සහ තවදුරටත් අතහැර දැමීම අවම කරගැනීමට උපකාරී වේ.

**<u>පරිශීලන කෘති (Referances)</u>**


Piyadasa, R. U. K., Ranasinghe, T. K. G. P. and Herath, H. M. M. S. D. (2018) 'Enhancing Community Resilience via Sustainable Management of Abandoned Paddy Lands in Bentota, Sri Lanka', *Colombo Journal of Multi-Disciplinary Research*, 3(2), p. 45.

Dhanapala, M. P. (2005) 'The wet zone rice culture in Sri Lanka: A rational look', *Journal of the National Science Foundation of Sri Lanka*, 33(4), pp. 277–279.

Alvi, M. H. (2016) 'A Manual for Selecting Sampling Techniques in Research Mohsin Hassan Alvi', *Journal*, 1(70218), p. 57.